## සීතාවක ප්‍රාදේශීය සභාව.
## 2018 වර්ෂයට අදාල වරිපනම් බදු පැනවීම.

සීතාවක ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටුකරන, සීතාවක ප්‍රාදේශීය සභාවේ ලේකම් කේ.ඒ. චන්දන පද්මසිරි වන මම 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 134 (1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2018 වර්ෂයට අදාලව වරිපනම් බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2017/10/12 දින අංක 9261 යටතේ තීරණය කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

2017/ 10/12 දින,
සීතාවක ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේදී,

කේ.ඒ.චන්දන පද්මසිරි,
ලේකම් හා බලතල,කාර්ය,කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
සීතාවක ප්‍රාදේශීය සභාව,
හංවැල්ල.

තීරණය

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 146 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ සීතාවක ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව * ශ්‍රීලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1374 හා 2004.12.31 දිනැති ගැසට් පත්‍රය යටතේ සහ 1486 හා2007-02-23 දිනැති ගැසට් පත්‍රය යටතේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල දියුණු කල ප්‍රදේශ යැයි ප්‍රකාශයට පත් කර ඇත්තා වූ ප්‍රදේශය ඇතුළත පිහිටියා වූ නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල, ගෙපත්වල, වාර්ෂික වටිනාකම සඳහා 2015 වර්ෂය සඳහා වූ තක්සේරුව / සත්‍යාක්ෂණය 2018 වර්ෂය සඳහා තක්සේරුව / සත්‍යාක්ෂණය ලෙස සම්මත කළ යුතු බවටත් එකී තක්සේරුව මත 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු 134 (1) උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර එකී දේපල මත ඉහත කී තක්සේරුව සඳහා වාර්ෂික වටිනාකමින් පළමු උප ලේඛනයේ හා දෙවන උපලේඛනයේ දෙවන තීරුවේ දක්වා ඇති ප්‍රමාණයේ ප්‍රතිශතයක වාර්ෂික වරිපනම් බද්දක් නියම විය යුතු බවටත්,

තවද, 2018 වර්ෂයෙහි පහත තුන්වන උප ලේඛනයේ සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර එසේ නියම කරන වාර්ෂික වරිපනම් බද්ද ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවිය යුතු බවටත්, එලෙස වාර්ෂික වරිපනම් බද්ද එම වර්ෂයෙහි ජනවාරි 31වන දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10 %) ක වට්ටමක්ද, එකී උප ලේඛනයෙහි එක් එක් කාර්තුව ඉදිරියෙන් තුන්වන තීරුවේ නිරූපිත දිනයට පෙර අදාල වරිපනම් බදු මුදල ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එක් කාර්තුවට අදාල මුදලින් 5 % ක වට්ටමක්ද ප්‍රාදේශීය සභාව ලබාදිය යුතු බවටත් තීරණය කරමි.

### ඉහත කී පළමු උපලේඛණය

| I තීරුව | II තීරුව |
|---|---|
| දියුණු ගම් ප්‍රදේශය | වරිපනම් බදු ප්‍රතිශතය |
| හංවැල්ල දියුණු ගම් ප්‍රදේශය | 6% |
| පාදුක්ක, කහහේන, කොස්ගම හා කලුඅග්ගල දියුණු ගම් ප්‍රදේශය | 6% |
| පිටුම්පේ දියුණු ගම් ප්‍රදේශය | 4% |

ඉහත කී දෙවන උපලේඛණය

| 1 තීරුව | 11 තීරුව |
|---|---|
| දියුණු ගම් ප්‍රදේශය | වරිපනම් බදු ප්‍රතිශතය |
| හංවැල්ල පරණ පාර ආටිගල පාලම අසල සිට කලුඅග්ගල හයිලෙවල් මාර්ගයට සම්බන්ධවන ස්ථානය දක්වා පාර දෙපස හා හයිලෙවල් පාර ගලගෙදර පාලම අසල සිට පුවක්පිටිය දක්වා ප්‍රධාන පාර දෙපස මීටර් 301 ක ප්‍රදේශය | 6% |
| ගලගෙදර හංදියේ සිට උඩුමුල්ල දක්වා පාර දෙපස මීටර් 201 ක ප්‍රදේශය | 4% |
| උඩුමුල්ල හන්දියේ සිට කහවල පාර දෙපස මීටර් 120 ක ප්‍රදේශය | 4% |
| කොළඹ පාර මීපෙ හංදියේ සිට පහළ බෝපේ අවසානය දක්වා පාර දෙපස මීටර් 120 ක ප්‍රදේශය | 4% |
| ඉහළ, බෝපේ හංදියේ සිට ගුරුලාන දක්වා පාර දෙපස මීටර් 120 ක ප්‍රදේශය | 4% |
| පිටුම්පේ පිංතාලියේ සිට වේවැල්පනාව පාර දක්වා පාර දෙපස මීටර් 201 ක ප්‍රදේශය | 4% |
| කලු අග්ගල හංදියේ සිට ලබුගම පාර තුම්මෝදර දක්වා පාර දෙපස මීටර් 201 ක ප්‍රදේශය | 4% |
| කොස්ගම සිට කණම්පැල්ල පාර පොලිසිය අසල පළමු බෝක්කුව දක්වා පාර දෙපස මීටර් 201 ක ප්‍රදේශය හා එතැන් සිට පාර අවසානය දක්වා පාර දෙපස මීටර් 120ක ප්‍රදේශය | 4% |
| ඇස්වත්ත පාර දෙපස මීටර් 120ක ප්‍රදේශය | 4% |
| සාලාව හංදියේ සිට අකරවිට පාර දෙපස මීටර් 120 ක ප්‍රදේශය | 4% |
| පහල බෝපේ සිට පාදුක්ක දක්වා පාර දෙපස මීටර් 120 ක ප්‍රදේශය | 4% |
| ගුරුලාන සිට උඩගම ප්‍රාදේශීය සභා සීමාව දක්වා පාර දෙපස මීටර් 120 ක ප්‍රදේශය | 4% |
| ඉහළ බෝපේ සිට ඉංගිරිය මාර්ගයේ ප්‍රාදේශීය සභා සීමාව දක්වා පාර දෙපස මීටර් 120 ක ප්‍රදේශය | 4% |
| පහත්ගම සිට වේවැල්පනාව දක්වා පාර දෙපස මීටර් 120 ක ප්‍රදේශය | 4% |
| වේවැල්පනාවේ සිට ඉරිදා පොළ දක්වා පාර දෙපස මීටර් 120 ක ප්‍රදේශය | 4% |

ඉහත කී තුන්වන උපලේඛණය

| 1 තීරුව | 11 තීරුව | 111 තීරුව |
|---|---|---|
| කාර්තුව | ගෙවිය යුතු දිනය | 5% වට්ටම සඳහා හිමිකම ලබන අවසාන දිනය |
| පළමුවන කාර්තුව | 2018 මාර්තු 31 | 2018-ජනවාරි 31 |
| දෙවන කාර්තුව | 2018 ජුනි 30 | 2018 අප්‍රේල් 30 |
| තුන්වන කාර්තුව | 2018 සැප්තැම්බර් 30 | 2018 ජූලි 31 |
| හතරවන කාර්තුව | 2018 දෙසැම්බර් 31 | 2018 ඔක්තොම්බර්31 |

සිංහල, දෙමළ, ඉංග්‍රිසි මාධ්‍යය වලින් පළ කරනු ලබන මෙම දැන්වීමෙහි එක් එක් භාෂා වලින් පළ කිරීමේදි යම් නොගැලපීමක් ඇතිවුවහොත් සිංහල මාධ්‍යයෙන් පළ කරන ලද දැන්වීම බලාත්මක වේ.